ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා අතිරේක දශවර්ගික
කාරක සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී,
විහාරගොඩ කැලේ විවේකසේනාසනාධිපති ත්‍රිපිටකාචාර්ය
අතිපූජනීය මහකුඹුක්වැවේ උත්තරවංශ
ස්වාමීන්ද්‍රයන් වහන්සේ පිළිබඳ

## සංක්ෂිප්ත

# ජීවන චරිතය

උපත: 1928.03.07 අපවත: 1997.12.21

සංස්කාරක:

**පූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ**

අනුග්‍රහය:
අම්බලන්ගොඩ ශ්‍රී විජය සුපර් ට්‍රැවල්ස්
කළමනාකාර අධ්‍යක්ෂක
**කේ.ජී. පියසේන මහත්මයා**

මුද්‍රණය:
පියසර මුද්‍රණ ශිල්පියෝ
උතුරු කළුතර.

2541/1997 12. 25



අතිපූජනීය මහකුඹුක්වැවේ උත්තරවංශ
ස්වාමීන්ද්‍රයන් වහන්සේ

## <u>සබ්බේ සංඛාරා අනිච්චාති - යද පඤ්ඤාය පස්සති</u>
## <u>අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා</u>

(ධම්ම පද)

"සකල සංඛත සංස්කාරයන් ඇතිව නැතිව යන බැවින් අනිත්‍යයි යම් දිනක සම්‍යක් ප්‍රඥාවෙන් දකින්නේ වේද, එකල්හි ස්කන්ධ දුක්ඛය කෙරෙහි විදර්ශනා ඥානයෙන් කලකිරීමට පැමිණෙයි, මේ දකීම වනාහි විශුද්ධිය නම් වූ නිර්වාණයට ඇති ඒකායන මාර්ගයයි"

ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ අතිරේක දශ වර්ගික කාරක සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී ධූරන්ධර, විහාරගොඩ කැලේවිවේක සේනාසනාධිපති, ත්‍රිපිටකාචාර්ය අතිපූජනීය මහකුඹුක්වැවේ උත්තරවංස ස්වාමීන්ද්‍රයන් වහන්සේ සම සැත්තෑ වසරක් ආයු වළඳ 1997 දෙසැම්බර් 21 ද අපවත් වී වදළ සේක.

1 - **උපත:**- ශ්‍රී ලංකාවේ රාජවංශයේ හා සම්බුද්ධ ශාසනයේ උත්තරීතර කේන්ද්‍රස්ථානය වන අනුරාධපුර දිසාවේ උතුරුමැද පලාතේ, හොරොව්පතාන කොට්ඨාශයේ මහකුඹුක්වැව ඓතිහාසික ගම්වරය පූජනීය උත්තරවංස ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ජන්ම භූමිය වන අතර, 1928 මාර්තු මස 07 දින උදය ඔර්ලෝසු පැයෙන් 7-54 ට යෙදුන උතුම් ශුභ මොහොතකින් උපත ලබා ඇත.

2 - **දෙමවුපියෝ:**- සිංහළ රටෙහි ඈත අතීතයේ සිටම අකලංක උසස් වංසවත් කුමාරසිංහ මුදියන්සේලාගේ පෙළපතෙහි, කේ. ඇම්. හේරත් බණ්ඩා සහ ඩී. බී. ඇම්. රන්එතනා පූජනීය ස්වාමීන් වහන්සේගේ භාග්‍යවන්ත මවුපිය දෙදෙනා වහන්සේ වූහ.

3 - **සොහොයුරෝ:-** වැඩිමල් එකම සොහොයුරුතුමකු හා සොහොයුරින් දෙදෙනකු ද ඇති වූ එම පවුලේ කණිටු පුත් රුවන බවට පත් වූ උත්තරවංස ස්වාමීන් වහන්සේ සැමදෙනාගේ ආදරයට පාත්‍ර වූ සේක. කුමාරසිංහ මුදියන්සේලාගේ පියදස නමින් සූවිසි වසරක් පමණ ගිහි ජීවියද ගත කළහ.

4 - **ජන්ම පත්‍රය:-** මීන ලග්න ධනු නවාංශක ඇතිව උපත ලබා ඇති ජන්ම පත්‍රයෙහි ගුරු ලග්න ස්ථාන යෙහිද සත්වැන්නෙහි සඳුද, නව වැන්නෙහි ශනි කෙහෙතු දෙදෙනාද, එකොළොස් වැන්නෙහි කුජ සිකුරු දෙදෙනාද, දෙළොස් වැන්නෙහි රවි බුද දෙදෙනා ද යෝග වී පිහිටා සිටින බැවින් විසාරද වූද සූරවීර ගති සහිත වූද පිනෙන් ගුණෙන් නුවණින් තේජවන්ත වූද ජන්ම ලාභයක් ලබා ගත් පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේ සුපරීක්‍ෂාකාරී දූරදර්ශී නුවණින් යුතු කිසි තැනක කිසිවිටක නොපරදින ජයග්‍රාහී ජීවිතයක් ගත කළ එම ගිහි පැවිදි සැම දෙනා සලකනුයේ අසීමිත ගෞරවයෙකිනි.

5 - **ශාසනික උරුමය:-** ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක ධූරන්ධර වූද, කොළඹ වැල්ලවත්තේ ශ්‍රී ධර්මෝදය පරිවේණාධිපති වූද ත්‍රිපිටක විශාරද පණ්ඩිතාචාර්ය රස්නක වැවේ ශ්‍රී සද්ධම්මවංස මාහිමියන් වහන්සේගේ පෙළපතෙහි මුණුපුරෙක් වන පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේ එමගින් ශාසනයෙහි ඤාති උරුමයද ලැබූහ.

උතුරු මැද පලාතේ ආණ්ඩුකාර මෛත්‍රීපාල සේනානායක මැතිතුමාගේ ඤාති සොහොයුරකු වන පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේ සම්භාවනීය ප්‍රභූවර ඥාතීන්ගේද සාමාජිකත්වයට පත්වූහ.

6 - **ශාසනගත වීම:**- වැඩිහිටියන්ගේ බලවත් අයැදීම මත විවාහ ජීවිතයට ඇතුලත් වුවද පුරාකෘත කුශලානු භාව බලයෙන්, ගිහි සැපත් හැරපියා තුරුණු වියේදීම සසුනට උරදී පැවිදිවනු පිණිස අතිපූජනීය රස්නකවැවේ අනුනායක මාහිමියන් වහන්සේ වෙත පැමිණි වැවේ අනුනායක මාහිමියන් වහන්සේ වෙත පැමිණිසේක් 1951 මැයි මස 21 දිනට උදපත් වූ වෙසක් පුන් පොහෝ දිනයේ උදර අධිෂ්ඨානයෙනි.

7 - **ගුරුපරපුර:**- අතිපූජනීය රස්නකවැවේ අනුනායක මාහිමියන් වහනේසේගේ සෙවනට සැපත් වූ පසු අතිපූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමියන් වහන්සේගේ සමුත්පාදකත්වයෙන් හා අතිපූජනීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඤණාරාම මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේගේ ප්‍රධානාචාර්යත්වයෙන් සමාරබ්ධ වූ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රථම යෝගාංකුරයන් දෙළොස්නමට ඇතුලත්ව සම්බුද්ධ ශාසනයේ නිර්මල ප්‍රව්‍රජ්‍යා භූමියට සැපැත් වූ පූජනීය උත්තරවංස ස්වාමීන් වහනේසේගේ ප්‍රව්‍රජ්‍යා මංගල්‍යය සිදු වූයේ අම්බලන්ගොඩ දෙල්දූව අරණ්‍ය භූමියේදී 1951 ජුනි මස 18 දිනට උදපත් වූ පොසොන් පුර පසළොස්වක් පොහෝ දිනයේදීය.

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ධුතාංගධාරී අතිපූජනීය ඉහළ පුලියංකුලමේ දීපංකර මහාහිමියන් වහන්සේ ද, තත් ශිෂ්‍ය වදුරැස්සේ රතනජෝති මාහිමියන් වහන්සේ ද, තත් ශිෂ්‍ය කඩවැද්දුවේ සුගුණතිස්ස මාහිමියන් වහන්සේද, අති පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන අස්මදචාර්‍ය්‍ය මාහිමියන් වහන්සේගේ සම්භාවනීය ගුරු පරපුරට ඇතුලත් වූහ.

අති පූජනීය බේරගොඩ උඩු පිල්ලේ මාහිමියන් වහනේසේ ද තත් ශිෂ්‍ය මාතලේ වරාපිටියේ සුමිත්ත මාහිමියන් වහන්සේද, තත් ශිෂ්‍ය මාතලේ අග්ග ධම්මාලංකාර මාහිමියන් වහන්සේද, අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඤණාරාම මහෝපාධ්‍යායන් වහන්සේගේ සම්භාවනීය ගුරුපරපුරට ඇතුලත් වූහ.

අල්පේච්ඡතා සන්තුට්ඨිතා සුභරතා විරියාරම්භතා ආදී අනේක ගුණ සමන්නාගත වූද ධූතාංගධාරී වූද ශාසන භාරධාරී මහා සංඝපිතෲන් වහන්සේගේ ආචාර්‍ය පරම්පාරාවට සම්බන්ධ වීමට ලැබීමද පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේගේ පුන්‍යානුභාව බලයෙන්ම සිදුවී ඇත.

8 - **එකට පැවිදි වූ පිරිස:-** 1951 ජුනි 18 දින එකට පැවිදි වූ පිරිස 12 නමකි. පූජ්‍ය ගාල්ලේ සුභූති මුල්ලේරියාවේ විධුර, බද්දේගම ජුතින්ධර, උඩවෙල සාරද, මාබෝදලේ සුමේධ, කිඹුල්ගොඩ සාසනධජ, වේරහැර සාසනයෝගී, කනන්කේ මුදිත, මහකුඹුක්වැව උත්තරවංස, අත්තනගල්ලේ සමෝධාධි, මැදවෙල වජිරයෝගී, බද්දේගම පේසල යන පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේ වෙති.

9 - **ගරු උපසම්පදාව:-** පුරා දෙවසරක් තිස්සේ ධම්විනය හදාරමින් භාවනා ප්‍රතිපත්ති පිරීමෙන් ආත්ම දමනය කරගත් තුදුස් නමක්, අම්බලන්ගොඩ දෙල්දූව මාදු නදියෙහි උදකුක්ඛෙප සීමා මාලකයේදී, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රථම උපස්මපද වාරයේදී 1953 ජුලි මස 16 වන දින අධිශීලෝප සම්පදවෙහි පිහිටුවනු ලැබූහ.

මානික්කාවේ චූළාභය හිමි, මාවතගම ගුණානන්ද හිමි, ගම්පොල චන්ද්‍රවිමල හිමි, වාගිරිගල ධම්මරතන හිමි, මුල්ලේරියාවේ විධුර හිමි, බද්දේගම ජුතින්ධර හිමි, උඩවෙල සාරද හිමි, කිඹුල්ගොඩ සාසනධජ හිමි, වේරහැර සාසනයෝගී හිමි, කනන්කේ මුදිත හිමි, මහකුඹුක්වැව උත්තරවංස හිමි, අත්තනගල්ලේ සමොධාධි හිමි, මැදවෙල වජිරයොගී හිමි, බද්දේගම පේසල හිමි යන පූජනීය ස්වාමීන් වහන්සේලා තුදුස් නම අතර පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේ අත්‍යුත්තම උපසම්පද භූමියට පැපත් වූහ.

10 - **ත්‍රිපිටක අධ්‍යාපනය:-** විහාරගොඩ විවේක සේනාසනාධිපති අතිපූජනීය අලුබෝමුල්ලේ අරියවංශ මාහිමියන් වහන්සේ, අතිපූජනීය මුනගම සිරිසුමන ස්වාමීන් වහන්සේ, අතිපූජනීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඥාණාරාම මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේ සහ අතිපූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන මාහිමියන් වහන්සේ ද සමීපයෙහි ත්‍රිපිටක ධර්මය පිළිබඳ පෙළ අටුවා ටීකා සහිත පූර්ණ අධ්‍යයනයක් ලත් පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේ ධර්ම විනය සම්බන්ධව නිවැරදි වූද පූර්ණ විනිශ්චය සහිතව විශාරද බවට පත් වූ සේක. තමන් වහන්සේ ලැබගත් ධර්ම විනය ඥානය සියගණනක් යෝගාවචර සහ පිරිසට නොමසුරුව බෙද දී වදළ සේක් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සලසාලමිනි.

11 - **වස් විසූ ස්ථාන:-** දේවගොඩ ශ්‍රී විජය යෝගාශ්‍රමය, කුරණ හදපාන්ගොඩ ශාන්තගිරි අරණ්‍යය, විහාරගොඩ විවේකසේනාසනය, නිදහන් ගල සෙනසුන, පුහුල්වැල්ල ශ්‍රී රෝහණ යෝගාශ්‍රම මධ්‍යස්ථානය, ගන්තිරියාව ශ්‍රී සුදශින යෝගාශ්‍රමය, කොග්ගල ත්‍රිපිටක ධර්මායතනය, වස්සාන තුදුසක්ම ගල්දූව ගුණවධීන යෝගාශ්‍රම මධ්‍යස්ථානයේ සහ සමවිසි වසක් පේළියට විහාරගොඩ විවේක සේනාසනයේදී වැඩ විසූ පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේ සුපරිශුද්ධ ලෙස උපසම්පද භූමියෙහි පිහිටා පුරා වසර 44 ක් තිස්සේ බුදුසසුන හෙබවූ සේක. පුරා සසාලිස් වසරක පැවිදි ජීවිතය සර්වාකාරයෙන් උතුම් බවට පත්කළ පූජනීය උත්තරවංස ස්වාමීන් වහනසේගේ අත්‍යුත්තම සීලස්කන්ධයට අපගේ නමස්කාරය වේවා.

12 - **දින චරියාව:-** අළුයම බ්‍රහ්ම මුහුර්තයේ අවදිව සුපුරුදු භාවනා වඩා බුද්ධ වන්දනා වතපිරිස මෙත් බවුන් සපුරා ආභිසමාචාරික වත්පිළිවෙත්හි යෙදී උදසන සුළු ආහාරයක් වළඳ සිසු පිරිසට ධර්ම විනය උගැන්වීමද, දවල් පිඬුසිහා පැමිණ පැන් පහසු වී දන් වළඳ දිවා බුද්ධ වන්දනා නිමවා

පුරා පස් පැයක් පමණ ධර්ම විනය උගන්වා වත පිළිවෙත ද සපුරා සන්ධ්‍යා බුද්ධ වන්දනා වත පිරිත බණ භාවනා නිමවා පිරිසට අවවාද අනුශාසනා කොට රාත්‍රි පෙරයම පුරා බණ භාවනා වන්හි යෙදෙමින් නොසිස්වූ දින චර්යාවක් පැවැත්වූ පූජනීය උත්තරවංස ස්වාමීන් වහනස්සේ නිරෝගිව සිටිනතාක් ධුතාංග ගුණ ධර්මද පරිහරණය කරමින් ආර්යවංශ ප්‍රතිපදවෙහි අප්‍රමාද වූ සේක.

13 - **ආශ්‍රිත සිසු පිරිස:**- ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රමයට අයත් ස්ථවිර මධ්‍යම නවක භික්ෂූන් වහන්සේ සිය ගණනක් ආශ්‍රය කළ පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේට අවසාන කාලසීමාවේදී සිසු පිරිස 13 නමක් පමණ සමීපචාරීව වැඩ සිටියහ. පූජ්‍ය මාලිබොඩ ගුණසෝම බටවංගල සුමනසිරි, තල්ගමුවේ සුධීරානන්ද, පුස්සැල්ලාවේ සද්ධාවංස, කලුබෝවිටියන සිරිවංස. පනංගල සුගතවංස කිරිවනාගොඩ සිරිසුමන, මාවරැල්ලේ සුගතධීර, කිරිවනාගොඩ සීවලි, එම, සිරිමංගල, එම අනුරවංස, බලන්ගොඩ අත්ථදස්සි, එම අභයවංස යන පූජ්‍ය කිංකර සිසු සහ පිරිස ඉතාමත් හිතාදරව පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේට සමීප චාරීම උපස්ථාන සලසමින් ශාසන ප්‍රතිපත්ති පිරීමෙහි නිරතව වැඩ සිටිති.

14 - **රෝගාතුර වීම:**- 1997 වස්සාන ආරම්භයේදීම දැඩිසේ රෝගාතුර බවට පත්වූ පූජනීය උත්තරවංස ස්වාමීන් වහන්සේ ගාල්ල කරාපිටිය, හා කොළඹ මහ රෝහලේදි ප්‍රතිකාර ලබමින් පුරා මාස පහක් තිස්සේ වෛද්‍ය විශේෂඥ පරාක්‍රම දිසානායක දෙස්තර මහත්මයාගේ වෛද්‍ය උපදෙස් මත වරින් වර සුවපත් වූ අතර දෙසැම්බර් 13 උදුවප් පුර පොහොද අසාධ්‍ය ලෙස සයනගත වූහ.

15 - **අපවත් වීම:-** දින අටක් තිස්සේ අතරක් නොහැර දැඩිසේ උපස්ථාන ලබමින් සිට සියලු සබ්‍රහ්මචාරීන් වහන්සේලාගේද දයක කාරකාදී සැම දෙනාගේද හිතෙෂී සමස්ත බෞද්ධ ජනතාවගේද බලවත් සංවේගය දනවමින් 1997 දෙසැම්බර් 21 ඉරුදින සවස 3.20ට පමණ අපවත් වී වදළ සේක.

16 - **ආදහන පූජාව:-** ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක ප්‍රධාන අනුශාසක අතිපූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන මාහිමිපාණන් වහන්සේ. ප්‍රධාන විශාළ සඝ පිරිසගේ ද, දස දහස් ගණන් සැදැහැවත් බොදු ජනතාවගේද සහභාගීත්වයෙන්ද 1997 දෙසැම්බර් 25 ගුරුදින ආදහන පූජාව ඉතාමත් ගෞරවාකාරයෙන් සිදු වූයේ ශීල සමාධපාදී ප්‍රතිපත්ති ධර්මයෙහි උදර ආනිසංස ප්‍රදර්ශන වෙමිනි.

අපවත් වී වදළ අතිපූජනීය උත්තරවංස ස්වාමීන්ද්‍රයන් වහන්සේට මතු උතුම් බුදුබව අත්වේවා!

**නාඋයනේ අරිධම්ම ස්ථවිර.**
ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය,
ගල්දුව - කහව.



ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන ලේකම් ත්‍රිපිටකාචාර්ය අතිගරු
මහකුඹුක් වැව උත්තරවංස මා හිමිපාණන් වහන්සේ.